// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2304/88 - 2022 නොවැම්බර් මස 05 වැනි සෙනසුරාදා - 2022.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රොෂාන් රණසිංහ** (පා.ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2022 මාර්තු මස 23 වැනි දින අංක 2272/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අවසන් වරට සංශෝධනය කරනු ලැබුවා වූ 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල 8 (1) (ආ) නියෝගය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**8 (1) (ආ) නියෝගය**

එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු සාක්ෂි හා අනෙකුත් අවශ්‍ය කරුණු ද විෂයභාර අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවන ලද ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් දහසක (රු. 50,000) ආපසු නොගෙවනු ලබන මුදල (ක්‍රීඩකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභියාචනා හැර) ගෙවූ බවට වන ලදු පතේ මුල් පිටපත ද එම අභියාචනය සමග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපත් හතරක් (04) සහිතව ඉදිරිපත් කළ යුතුය.

අභියාචනා සඳහා ගෙවනු ලබන සියලු මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කළ යුතුය.

EOG 11-0061

1A - G 37999 — 08 (2022/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*